ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2196/42 - 2020 ඔක්තෝබර් මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2020.10.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

5 වන සංශෝධනය

**ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථාව**

අංක 2137/26 හා 2019 අගෝස්තු 20 දිනැති, අංක 1992/77 හා 2016 නොවැම්බර් 11 දිනැති, අංක 1816/32 හා 2013 ජුනි 28 දිනැති සහ අංක 1783/37 හා 2012 නොවැම්බර් 09 දිනැති, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත අංක 1670/32 හා 2010 සැප්තැම්බර් 10 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය විය යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එම්. ඒ. බී. දයා සෙනරත්,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2020 සැප්තැම්බර් මස 30 වැනි දින.

1A - G 32821 — 25 (2020/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**යෝජිත සංශෝධනය**

**05.** වැටුප්

5.1 වැටුප් කේත අංක : ජ්‍යෙෂ්ඨ විධායක - SL-3-2016
විධායක - SL-1-2016

5.2 වැටුප් පරිමාණය : ජ්‍යෙෂ්ඨ විධායක - SL-3-2016-රු.88,000-12 x රු. 2,700- රු. 120,400
විධායක - SL-1-2016-රු. 47,615-10 x රු. 1,335-8 x රු. 1,630-17 x රු. 2,170 - රු. 110,895

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප :

| *ශ්‍රේණිය* | *වැටුප් පියවර* | *මූලික වැටුප (මාසික)* |
|---|---|---|
| III ශ්‍රේණිය | 1 (SL - 1 - 2016) | රු. 47,615 |
| II ශ්‍රේණිය | 12 (SL - 1- 2016) | රු. 62,595 |
| I ශ්‍රේණිය | 20 (SL - 1- 2 016) | රු. 76,175 |
| විශේෂ ශ්‍රේණිය | 1 (SL - 3 - 2016) | රු. 88,000 |

**07.** බඳවා ගැනීමේ ක්‍රමය :

7.3 සීමිත බඳවා ගැනීම

7.3.2.3 පළපුරුද්ද :

සිය පත්වීම්වල ස්ථිර කර ඇති, අයදුම්පත් කැඳවීමේ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරන දිනට හෝ ඊට පෙර ඉහත 7.3.2.1 හි සඳහන් සුදුසුකම් සහිත රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයක රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2016 හි වැටුප් කේත අංක MN-1-2016 හෝ ඊට ඉහළ MN වැටුප් කේත අංකයක් යටතේ වැටුප් ලබන හෝ SL-1-2016 වැටුප් කේත අංකය යටතේ වැටුප් ලබන හෝ සේවයක/තනතුරක අවුරුදු පහකට (05) නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**10.3 I ශ්‍රේණියේ සිට විශේෂ ශ්‍රේණියට උසස් කිරීම**

10.3.1 සපුරාලිය යුතු අවශ්‍යතා :

i. අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය. (ඉ පරිශිෂ්ඨයේ සඳහන් පරිදි)
ii. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට සේවයේ පළමු ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා පළමු ශ්‍රේණියට උසස් කිරීමෙන් පසු වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.
iii. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට සේවයේ වසර දහ අටකට (18) නොඅඩු සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
iv. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට පූර්වාසන්න වසර පහ (05) තුළ වාර්ෂික කාර්ය සාධනය සතුටුදායක හෝ ඉහළ මට්ටමක පැවතීම.
v. උසස් කිරීම සඳහා සුදුසුකම් පරීක්ෂා කරනු ලබන දිනට රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.
vi. තුන්වන කාර්යක්ෂමතා කඩඉම නියමිත දිනට සම්පූර්ණ කර තිබීම.

**10.3.2 උසස් කිරීමේ ක්‍රමය :**
ඉහත සුදුසුකම් සම්පූර්ණ කරන නිලධරයකු සෑම වසරකම ජනවාරි මස 01 හා ජූලි මස 01 දිනට පවත්නා පුරප්පාඩු අනුව විශේෂ ශ්‍රේණියට උසස් කිරීම රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

සටහන :

1. පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතාවය අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන්නේ පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයකට නොවැඩි 10.3.1 හි සුදුසුකම් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සංඛ්‍යාවක් පමණි.

2. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන නිලධාරීන්ගේ මූලික සුදුසුකම් හා ජ්‍යෙෂ්ඨතාවය පරීක්ෂා කිරීම පමණක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් සිදු කරනු ලැබේ.

3. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලබන නිර්දේශ අනුව පුරප්පාඩු ගණනය කරනු ලබන දිනට I ශ්‍රේණියේ සිටින නිලධාරීන්ගේ ජ්‍යෙෂ්ඨතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් විශේෂ ශ්‍රේණියේ පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන නිලධාරීන් සංඛ්‍යාවක් විශේෂ ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.